// ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශේෂ

අංක 161/14 — 1975 මැයි මස 02 වැනි සිකුරාද — 1975.05.02

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)

## මිළ පාලන දැන්වීම්

අංක සී 561 දරණ ආහාර මිළ නියෝගය

ශුද්ධ නොකළ දුඹුරු සීනි සහ ශුද්ධ කළ සුදු සීනි

මිළ පාලන පනත

4 වැනි වගන්තිය යටතේ නියෝගය

(173 වැනි අධිකාරය වන) මිළ පාලන පනතේ 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර (ආහාර හා විවිධ ද්‍රව්‍ය) මිළ පාලක විල්ප්‍රඩ් ජයසූරිය වන මම—

(1) 1974 ඔක්තෝබර් මස 24 වැනි දින අංක 134/6 දරණ ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1974 ඔක්තෝබර් මස 23 වැනි දින අංක සී 554 දරණ ආහාර මිළ නියෝගය වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යයක් තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක්ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, ශ්‍රී ලංකාව ඇතුළත විකිණිය හැකි උපරිම මිළ වහාම ක්‍රියාත්මක වන පරිදි මේ උපලේඛනයේ 2 වෙනි, 3 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි ද්‍රව්‍යකින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණු දිනය ;
(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණු ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණු ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඇ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතුබවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

1975 මැයි මස 2 වැනි දින පෙ.ව. 9.00 ට කොළඹ දී අත්සන් කරන ලදී.

විල්ප්‍රඩ් ජයසූරිය,
මිළ පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය).

උප ලේඛණය

| 1 වැනි තීරය<br>විස්තරය | | 2 වැනි තීරය<br>තොග වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි උපරිම මිළ | | 3 වැනි තීරය<br>සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි උපරිම මිළ |
|---|---|---|---|---|
| | | රු. ශ. | ... | රු. ශ. |
| (i) ශුද්ධ නොකළ දුඹුරු සීනි හෝ ශුද්ධ කළ සුදු සීනි (සලාකය ) ... | ... | 78 45 | ... | 0 72 |
| (ii) ශුද්ධ නොකළ දුඹුරු සීනි හෝ ශුද්ධ කළ සුදු සීනි (සලාකයෙන් පිට) | ... | 837 81 | ... | 7 50 |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි උපරිම මිළ ගණන්ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැක.

(2) සලාකය යනුයේ ආහාර පාලක විසින් නියම කරන ලද සලාකය ය.

5-254

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී